අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/02/29/21/06

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.04

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසුකම්ලාභීන් සියලුදෙනා වෙත ,

**<u>දිවයිනේ ජාතික පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට බඳවා ගැනීම- 2023 (2024)</u>**

ඉහත බඳවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධ කරන ලද අංක 2359 හා 2023.11.17 දිනැති ගැසට් නිවේදනය අනුව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා ඔබේ සුදුසුකම් පරීක්ෂා කර බැලීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය 2024.04.29 දින සිට බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවැත්වේ.

02.මේ සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ නාමලේඛන ඇමුණුම 01 හි ඇතුලත් වේ.

**<u>01. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය</u>**

1.1 එම ඇමුණුම් 01හි ඇතුලත් සුදුසුකම් ලැබූවන් පහත සඳහන් සහතික/ලේඛනවල **<u>මුල් පිටපත් හා ඡායා පිටපත් (තමා විසින් සහතික කරන ලද) වෙන් වෙන්ව</u> අමුණන ලද** ගොනු දෙකක් ද රැගෙන එහි සඳහන් නියමිත වේලාවට සහභාගී වන ලෙස කාරුණිකව දන්වමි.

I. ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය
II. උප්පැන්න සහතිකය.( කෙටි උධෘත භාරගනු නොලැබේ. විවාහයෙන් පසු නම වෙනස් කර ඇත්නම් විවාහ සහතිකය ද සමඟ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුවේ.)
III. **<u>විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අ.පො.ස.සාමාන්‍ය පෙළ විභාග සහතිකය</u>** (විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය හා විදේශීය අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය හා සමානව පිළිගනු ලබන විභාග සමතුන් විසින් ඒ බව සහතික කරන ලද විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද සහතිකය රැගෙන පැමිණීම අනිවාර්ය වේ.)
IV. වලංගු උපාධි සහතිකය හා උපාධියට හදාරා ඇති විෂයයන් ඇතුළත් සවිස්තරාත්මක ප්‍රතිඵල සටහන (Academic Transcript) අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුවේ.
V. උපාධිය හදාරා ඇත්තේ දේශීය රාජ්‍ය නොවන විශ්ව විද්‍යාලයකින් හෝ විදේශීය විශ්ව විද්‍යාලයකින්නම් එම විශ්ව විද්‍යාලය/ උපාධි පිරිනමන ආයතනය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක්/ආයතනයක් ද යන්න තහවුරු කෙරෙන ලේඛනයක්
VI. උපාධිය හදාරන ලද මාධ්‍යය සනාථ කරන ලියවිලි
VII. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය
VIII. මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික 01
IX. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන සහතිකවල නමේ වෙනස්කම් පවතී නම් ඊට අදාළව දිවුරුම් ප්‍රකාශ

ඉහත දක්වා ඇති සියලුම ලේඛන **<u>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ දිනයේදී ම ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛන භාර ගනු නොලැබේ.</u>**

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්, එදිනම පැවැත්වෙන ප්‍රායෝගික පරීක්ෂණයට ද සහභාගී විය යුතු වේ.

## 02. ප්‍රායෝගික පරීක්ෂණය

2.1. අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.4 වගන්තිය අනුව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වන ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පහත පරිදි සූදානම්ව සහභාගී වන ලෙස කාරුණිකව දන්වමි.

2.2 මෙම පරීක්ෂණය ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ "ආ" පරිශිෂ්ටයට අනුව පහත පරිදි සිදු කෙරේ.

2.3 ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනා ගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | අරමුණ හා ප්‍රවිෂ්ට වීම | 05 | 02 |
| 2 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 3 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 4 | කාල කළමනාකරණය | 05 | 02 |
| 5 | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| **මුළු ලකුණු ප්‍රමාණය** | | **25** | **10** |

2.4 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය

I. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 5කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.

II. ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.

III. ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

IV. ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ
.

2.5 නිර්ණායකයන්හි අරමුණ

I. අරමුණ හා ප්‍රවිෂ්ට වීම
සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම

II. පෞරුෂය හා හඬ පාලනය
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දි මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම

III. සන්නිවේදනයේ පැහැදිලි බව
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දි අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම

IV. කාල කළමනාකරණය
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළගා වීමේ කුසලතාවය ඇගයීම

V. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය
අරමුණ කෙරෙහි ළගා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම

**03**. ඉහත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නියමිත දිනයේ දී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව පසුව කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

**04**. මෙම පරීක්ෂණ සඳහා සහභාගී වීමම පත්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන බව ද සැලකිය යුතුය.

**05**. මෙම පරීක්ෂණවලට සහභාගී වීම සඳහා ගමන් වියදම් හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

ඒ.ජේ.එස් එස්.එදිරිසූරිය
අතිරේක ලේකම් (ආයතන)

අත්/කලේ, ජේ.එම්.තිලකා ජයසුන්දර
අධ්‍යාපන ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය